මහනුවර අලවතුගොඩ ප්‍රදේශයේ අතුරුදන් වූ බවට වාර්තා වූ කාන්තාවකගේ මළසිරුර වෙල් යායකින් හමුවීමත්, ඒ සම්බන්ධයෙන් විමර්ශණ පැවැත්වීමත් සම්බන්ධයෙන් මාධ්‍ය අවධානය යොමු වී තිබිණි. පුවත්පත් කිහිපයක ඒ සම්බන්ධයෙන් ආවරණය වී තිබූ ආකාරය මෙසේ දැක්විය හැක.

* දිවයින (මාර්තු 13, 2023) - "රූමත් කතක් අලවතුගොඩ වෙල්යායක මඬේ ඔබා ඝාතනය කරලා".
* අරුණ (මාර්තු 13, 2023) - "අලවතුගොඩ කාන්තාව ඝාතනයට පෙර දූෂණය කරලා" (ඝාතනයට ලක් වූ අය "සුරූපී කාන්තාවක" යැයි පුවතෙහි සඳහන් වේ).
* ලංකාදීප (මාර්තු 14, 2023) - "අලවතුගොඩ රූමතිය ඝාතනය: මිනීමරුවාගේ ඔත්තුව දුන් ගොයම් ගහ".
* අරුණ (මාර්තු 14, 2023) - "අලවතුගොඩ කත නිවසේදීම දූෂණය කර මැරුවාදැයි සැකයක්" (ඝාතනයට ලක් වූ අය "සුරූපී කාන්තාවක" යැයි පුවතෙහි සඳහන් වේ).

(මාර්තු 13, 2023 සහ මාර්තු 14, 2023 දිනයන් හි අරුණ පුවත් වාර්තාවන් දෙක තුළ, ඝාතනයට ලක් වූ අය ලිංගික අපරාධයකට ලක්ව තිබුණු බවට සැකයක් පවතින්නේ යැයි සඳහන් වේ.)

1) මිය ගිය කාන්තාව ලිංගික අපරාධයකට ලක්ව ඇති බව දැක්වීමත්, ඇගේ බාහිර රූපය "රූමත්", "සුරූපී" වැනි යෙදුම් ඔස්සේ දැක්වීමත් ඔස්සේ, මෙම සිදුවීම හැඟීම් කළඹවන (භාවාතිශය) ආකාරයකින් ඉදිරිපත් නොකෙරෙන්නේ ද?

2) ඇගේ බාහිර රූපය ඉස්මතු කොට දැක්වීම පුවතට කෙතරම් අදාළ වන්නේ ද?

3) "දූෂණය" යන යෙදුම ඔස්සේ, ඊට මුහුණ පෑ අයෙකු අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වන හෙයින්, වඩාත් යෝග්‍ය වන්නේ "ලිංගික අපරාධය" වැනි යෙදුමක් නොවේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

